මීලඟ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ද? තහවුරු කරගත් ආරංචියක් ද?.
ශ්‍රී ලංකා පොලිසියේ 36 වෙනි පොලිස්පතිවරයා ලෙසින් පත්වන්නේ කවුරුන්ද, ඒ දේශබන්දු තෙන්නකෝන් ද යන්න පිළිබඳව, පුවත් වාර්තාවන් තුනක් ඔස්සේ දැක්වී තිබූ ආකාරය පහත පරිදි වේ.
දිවයින - "මීලඟ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්?" (එය සිදුවීමට බොහෝ දුරට ඉඩ ඇති බව, පොලිස් මූලස්ථාන ආරංචි මාර්ග මූලාශ්‍ර ලෙසින් දක්වමින් පවසයි).
මව්බිම - "මීලඟ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්?" (ඔහු පත්වනු ඇතැයි විශ්වසනීය ආරංචි මාර්ග මූලාශ්‍ර ලෙසින් දක්වමින් පවසයි).
අරුණ - "නව පොලිස්පති දේශබන්දු" (මෙම පත්වීම සිදු කරන ලෙසට ජනපති වික්‍රමසිංහ විසින් මාර්තු 16 දින මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව පවසයි. නිශ්චිත මූලාශ්‍රයක් සඳහන් නොවේ).
මෙසේ නිරීක්ෂණය කරන විට, දිවයින සහ මව්බිම පුවත් වාර්තාවන්, මෙය සිදුවීමට ඇතැම් විට/බොහෝ දුරට හැකියාවක් ඇති එකක් ලෙසින් දක්වමින්, ප්‍රශ්නාර්ථයක් සහිතව සිරස්තල දක්වමින් පුවත වාර්තා කර ඇත.
අරුණ පුවත් වාර්තාව, මෙය නිශ්චිත කරුණක් ලෙසින් දක්වමින් පුවත වාර්තා කර ඇත. නමුත්, ඒ සඳහා මූලාශ්‍රයක් නිශ්චිතව සඳහන් කර නොමැත.
ඒ අනුව, වඩාත් පිළිගත හැකි යැයි පාඨක ඔබ තෝරාගන්නේ කුමන පුවත් වාර්තාව(න්) ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

